# පොලොන්නරුවේ හිටි පිළිම වහන්සේ ආනන්ද පිළිමය ද?

**සේනාධීර මහතා**

පොළොන්නරු ගල් විහාරයෙහි දක්නට ලැබෙන සිටි පිළිමය පිළිබඳ ව දැනට උගතුන් මත කිහිපයක් පළ කොට ඇත. පොළොන්නරු සිටි පිළිමය නෙළා ඇත්තේ දෑත් බැඳගෙන සිටින සේ බැලූ බැල්මට පෙනී යන ඉරියව්වෙකිනි. පිළිමයේ ප්‍රහේලිකාව මෙයයි. මෙසේ දෑත් බැඳගෙන සිටින්නා කවරෙක් ද? කවර හෙයින් එසේ කෙරේ ද යනු මෙහි ලා නිතැතින් ම නැඟෙන පැනයි. දෑත් බැඳගත් ඉරියව්වෙකින් සිටින සේ බුදු පිළිම නෙළීම සාමාන්‍ය සිරිත නො වේ. බෞද්ධ ලෝකයට අයත් නොයෙක් රටවල දැනට නෙළා ඇති බුදු පිළිම අයත් වන්නේ නැඟිට සිටීම, වැඩ සිටීම, සැතපීම යන ප්‍රධාන තුන් ඉරියව්වට ය. මෙයට අමතර ව, දහම් දෙසීම, සමවත් සුවයෙන් පසුවීම, පිරිනිවන් යහනෙහි සැතපීම යන ඉරියවු නිරූපණය කෙරෙමින් නෙළන ලද පිළිම ද හැම බෞද්ධ රටෙක ම පාහේ දැකිය හැකි ය. දෑත් බැඳගත් ඉරියව්වෙන් නෙළන ලද, බුදුරදුන් ගේ හෝ ශ්‍රාවකයන්ගේ හෝ යැයි සිතිය හැකි ප්‍රතිමා කිහිපයක් තවත් රටවල් දෙක තුනකින් ද ලැබී ඇතත් පොළොන්නරුවේ ගල් විහාරයෙහි දක්නට ලැබෙන තරම් විශාල ප්‍රතිමාවක් ඒ කොතැනෙක වත් නැත. තව ද, එයට වම්පසින් ඇති විශාල ප්‍රතිමාවෙහි දක්නට ලැබෙනුයේ සැතැපෙන ඉරියව්ව ය. එහෙත් මේ ඉරියව්වෙන් නිරූපිත වන්නේ සැතපීම ද? නොහොත් පිරිනිවන් පෑම ද යනු ඉක්බිති මතු වන විමතියයි. බොහෝ උගතුන් ගේ මතය නම් ඉන් දැක්වෙනුයේ පිරිනිවන් පෑ ඉරියව්ව බවයි. 'සැතපෙන' පිළිමයෙන් දැක්වෙනුයේ පිරිනිවන් පෑ බුදුරදුනැ'යි ගැනෙත් ම එයට දකුණු පසින් පෙනෙන සිටි පිළිමය බුද්ධෝපස්ථායක ආනන්ද හිමියන් ගේ යැයි සැලැකීමට ඉඩ ඇති බව මෙකී උගතුන් ගේ මතයයි. දෑත් බැඳගෙන ශෝකී ස්වභාවයෙන් කිසියම් අරමුණක් කෙරෙහි සිත යොමු කෙරෙමින් සිටින්නා සේ දැක්වෙනුයේ ඒ වන විටත් පුහුදුන් තත්ත්වයෙන් පසු වූ අනඳ හිමියන් බුදුරදුන් ගේ පිරිනිවන් පෑමෙන් කම්පාවට පත් ව සිටින සැටි නිරූපණය කිරීමෙකැයි ගන්නා මේ උගත්තු ඒ අනුව මෙකී පිළිම දෙකින් දැක්වෙනුයේ සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ මූර්ති ශිල්පීය නිරූපණයෙකැයි තීරණය කෙරෙති.

මෙයට මඳකින් වෙනස් වූ මතයක් අභාවප්‍රාප්ත පුරාවිද්‍යාඥයකු වූ ඩී. ටී. දේවේන්ද්‍ර මහතා විසින් පළ කරන ලදී. ආසියානු කලා කෘතීන් පිළිබඳ ව නිව්යෝක් නගරයෙහි පළ කරවනු ලබන ප්‍රශස්ත සංග්‍රහයක් වන 'ආටිබුස් ඒෂී' නමැති සඟරාවට මෙකී විවාදලක්ෂ්‍ය ප්‍රතිමාව ගැන

ලිපියක්[1] සැපයූ ඒ මහතා මින් නිරූපිත වන්නේ අනඳ හිමියන්ය යන අදහසට තමා එකඟ වෙතත් ඉන් නිරූපිත ව ඇත්තේ වෙනත් ඉරියව්වෙකැයි කියා සිටියේ ය. තම මතය සනාථ කරනු සඳහා සමාන ඉරියව්වෙකින් යුතුව මෙ රට හා පිට රට නිමවන ලද පැරණි ප්‍රතිමා කිහිපයක් සහ පොළොන්නරුවේ තිවංක පිළිම ගෙයි බිතු සිතුවම්වලින් උපුටා ගැනුණු ස්ත්‍රී–පුරුෂ රූප කිහිපයක් ද ඒ මහතා විසින් නිදසුන් ලෙස මේ ලිපියට ඇතුළත් කරනු ලැබ ඇත. නිදසුන් ලෙස ඉදිරිපත් කරන ලද ප්‍රතිමාවලින් එකක් අටවන සියවස තුළ ජපානයෙහි නිමවන ලදැයි සැලැකෙන ලෝහමය කෘතියෙකි. ගලින් නෙළන ලද සෙසු පිළිම දෙකින් එකක් තිස්සමහාරාමයේ යටාල වෙහෙරින් නඟාගන්නා ලද හිස සුන් රුවෙකි. අනෙක රිටිගල නටබුන් අතරින් සොයා ගන්නා ලද්දෙකි. තිංවකයෙහි බිතු සිතුවම් අතරින් උපුටා ගන්නා ලද එක් නිදසුනෙකින් දහම් දෙසන බුදු රදුන් ගේ හා දෑත් බැඳගෙන ඊට සවන් දෙන භික්ෂුවක් ඇතුළු තවත් භික්ෂූන් තිදෙනකු ගේ නිරූපණයක් දක් වේ. තවත් නිදසුනෙකින් දක්වෙනුයේ ද දහම් දෙසන බුදු රදුන් ගේ හා එයට සවන් දෙන භික්ෂුවක ගේ ද නිරූපණයෙකි. තුන්වැන්නෙන් නිරූපිත වනුයේ ඔවා දෙන වැඩිමහල්ලකුත් එකත්පස් ව හිඳිමින් ඔහුට සවන් දෙන තරුණියකත් ය. මේ නිදසුන්වලට අමතර ව දකුණු ඉන්දියාවේ පංචායාත් උසාවිවල විනිසුරු ගේ බසට සවන් දෙමින් සාමාන්‍ය ජනයා සිටින ඉරියව්ව ද දේවේන්ද්‍ර මහතා ඉදිරිපත් කොට ඇත. මේ හැම රුවෙක ම දෑත් පිහිටුවා ඇත්තේ පොළොන්නරුවේ සිටි පිළිමයේ පිළිවෙලට ම බව පවසන ඒ මහතා ඒ අනුව එ කී පිළිමයෙන් නිරූපිත වන්නේ බුහුමන් සහිත ව බුදු රදුන් කෙරෙහි සවන් දී සිටින අනඳ හිමියනැයි යන නිගමනයට බසී.

ඉහත දක්වුණු දෙ මතයෙහි එකිනෙකට මඳ වෙනසක් දක්නට ලැබෙතුදු එක් කරුණක් අතින් ඒ දෙකින් ම කියැවෙනුයේ එකකි. එ නම්, පොළොන්නරු ගල් විහාරයෙහි දක්නට ඇත්තේ ආනන්ද ප්‍රතිමාව බවයි. එහෙත් මේ අදහස පිළිගැන්මෙහි ලා සරස් වන කරුණු කිහිපයෙක් වෙයි:–

(1) පොළොන්නරුවේ ගල් විහාරයෙහි දක්නට ලැබෙන පිළිම ගණන සතරෙකි. එ නම්, 'පරිනිර්වාණ මංචකයෙහි' සැතපෙන බුදු රදුන් ගේ යැයි සාමාන්‍යයෙන් සැලැකෙන පිළිමය, ප්‍රස්තුතයට ලක් ව ඇති සිටි පිළිමය, එයට දකුණු පසින් දක්නට ලැබෙන 'සමාධි' පිළිමය හා එයට ද දකුණු පසින් පිහිටි 'වජ්‍රධර ගුහා' නමින් හැඳින්වෙන පර්වත කුටියෙහි දක්නට ලැබෙන සමාධි පිළිමයත් ය. මෙහි අවසනට කියැවුණු පිළිමය හැරෙන්නට සෙසු පිළිම තුන ම දනට ඇත්තේ විවෘත ව ය. එහෙත් පිළිම නෙළන ලද මුල් කාලයෙහි මේ තුන ම එක් වහලක් යටතේ, එහෙත් බිත්තිවලින් බෙදා වෙන් කරන ලද කුටි නොහොත් ශාලා තුනක් තුළ පැවැති බව එහි ඇති පැරණි ගඩොළු බැම්වල ඉතිරි ව ඇති පාදම්වලින් පැහැදිලි වේ. ඉදින් සිටි පිළිමයෙන් නිරූපිත වන්නේ අනඳ හිමියන් නම් පිරිනිවන් පාමින් හෝ සැතපෙමින් හෝ වැඩ සිටින බුදු රදුන් ළඟ ම විනා උන් වහන්සේ ගෙන් වෙන් ව, හුදෙකලා ව වෙනත් කුටියක් තුළ පසු වන සේ එ හිමියන් නිරූපණය කරනු ලැබීම සුදුසු නො වේ. අප ඉහතැ සඳහන් කළ පරිදි, සිටි පිළිමය පැවැතියේ වෙන ම කුටියක් තුළ නම් බුදු රදුන් වෙත සවන් දී සිටින අනඳ හිමියන් ඉන් නිරූපිත වෙතැයි සැලකීම අසීරු ය. එලෙස අනඳ හිමියන් පසු වීම බුදු රදුනට කැරෙන නිගරුවක් ද වන හෙයිනි.

(2) ඉදින් මේ පිළිමයෙන් නිරූපිත වන්නේ බුදු රදුන් පිරිනිවන් පෑමේ වියොවින් කම්පාවට පත් ව සිටින අනඳ

එනම්, 'දෙ තන මතැ සියතින් ස්වස්තිකය තනන්නී' නොහොත් 'දෙ තන වසා සියතින් ස්වස්තිකය තනන්නී' යන අරුතයි.

ස්වස්තිකයට ඉතා පැරණි ඉතිහාසයක් ඇත. ස්වස්තිකය තරම් පෙරදිග මෙන් ම අපර දිග ද අතිදීර්ඝ කාලාන්තරයක් පුරා එක සේ සම්භාවනයට පත් තවත් සංකේතයෙක් නැත.[3] ශුභදයක වූත් අභිවෘද්ධිදයක වූත් මංගල චිහ්නයක් ලෙස ඉතා ආදියෙහි පටන් ඉන්දියාවෙහි[4] ස්වස්තිකයට ලැබී පැවැතියේ ඉතා උසස් තැනෙකි. බුදු පිළිමයට ස්වස්තික ලක්ෂණය එක් වූයේ මංගල ලක්ෂණ කැවීමෙන් එහි 'අභිමංගල' ගුණය දියුණු තියුණු කොට ගැන්මේ උපක්‍රම සෙවීමට මහායානිකයන් තුළ පැවැති උනන්දුව හේතු කොට ය. පපුව මත කතිර හැඩයට දැත් තබා ගැනීමෙන් සමාධියට පිවිසීම මින් අපේක්ෂිත ය. වැඩ සිටි ඉරියව්වෙන් සමාධියට සම වැදීමේ දී අවශ්‍ය වන්නේ 'ස්වස්තික පාද' ඉරියව්ව ය. ස්වස්තික මුද්‍රාව සහිත ව සමාධිය නිරූපණය කිරීමෙන් සිටි ඉරියව්වෙන් බුදු රදුන් සමවතට පිවිසෙන සැටි නිරූපණය වන අතර මංගල ලක්ෂණයක් ද ආරෝපණය වන්නට සැලැස්වීමෙන් 'මංගල සංකේතයක්' ලෙස බුදු පිළිමයේ අගය ද දියුණු වී වැදීමෙන් ලබන පිනට අමතර ව මංගල වස්තුවෙකින් ලැබෙන ශුභ ශාන්තිය ද බැතිමතාට ලබාදීම මෙහි පරමාර්ථය වූ බව සිතිය හැකි ය. අනුරාධපුර යුගයේ පශ්චිම භාගයෙහි බුදු පිළිමය මංගල සම්මත වස්තුවක් ලෙස සලකා උපහාර, පරිහාර පැවැත්වීමෙන් ආශිර්දනය, ශුභසාධනය, ආරෝග්‍යසම්පත්තිදනය වැනි ශාන්ති කර්ම සඳහා යොදා ගනු ලැබූ බවට පැහැදිලි සාක්ෂ්‍ය දක්නට ඇත.

බුදු පිළිමයට මෙ වැනි ලක්ෂණ පිවිස වීමට මහායානිකයන් උනන්දුවක් දැක්වීම ස්වාභාවික ය. පොළොන්නරුවේ ගල් විහාරයෙහි දක්නට ලැබෙන පිළිමවලට තාන්ත්‍රික ලක්ෂණ කැවී ඇති බව පිළිගත් අදහසෙකි.[5] ඉන්දියාවේ පාල රාජ සමයෙන් (ක්‍රි. ව. 10–12 සියවස්) ඇරඹී අනුරාධපුර යුගයේ පශ්චිම භාගයෙහි ලක්දිව පැතිර ගිය තාන්ත්‍රික දෘෂ්ටියේ බලපෑම පොළොන්නරු යුගයේ බෞද්ධ කලා කර්මාන්තයන්හි දැකිය හැකි ය. මෙ සේ සලකත් ම පොළොන්නරු ගල් විහාරයෙහි දක්නට ලැබෙන සිටි පිළිමය අනෙකක් නො ව, සිටි ඉරියව්වෙන් සමවතට සම වැද සිටින බුදු රදුන් නිරූපණය කරන්නෙක යනු පැහැදිලි වේ. 'ස්වස්තික හස්තය' මෙ කී සමාධි ඉරියව්වේ අවශ්‍ය ලක්ෂණයෙකි. 'ගමනෙහි, සිටගැන්මෙහි, හිඳ ගැන්මෙහි මෙන් ම සැතපීමෙහි ද සති සම්ප්‍රජන්‍යයෙන් පැවතිය යුතු' බව බුදු රදහු වදළහ.[6] පොළොන්නරු ගල් විහාරයෙහි මේ හැම ඉරියව්වෙන් ම සමාධියට සමවැද සිටින බුදු රදහු නිරූපිතයහ. ගමන, සිටගැනීම යන ඉරියවු දෙක ම සිටි පිළිමයෙන් නිරූපිත ය. 'ස්වස්තික පාද' ලක්ෂණ සහිත වැඩ සිටි පිළිමයෙනුත් සැතපෙන ඉරියව්ව සහිත සැතපෙන පිළිමයෙනුත් සමවත් සුව විඳින බුදු රදහු දැක්වෙති. යටාල වෙහෙරේ පිළිමයෙහි මෙන් ම රිටිගල විහාරයේ පිළිමයෙහි ද ඇත්තේ 'ස්වස්තික හස්ත' ලක්ෂණයයි.

1. D. T. Devendra, **An unusual hand - position in Ceylon Statuary.,** Artibus Asie, Vol. XIX, 1956.
2. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය ලංකා ඉතිහාසය. 11 වැනි වෙළුම. 605 වන පිටුව.
3. ස්වස්තිකයේ ඉතිහාසය හා වැදගත්කම ද පිළිබඳ ව මේ පොත් බලන්න:
   (1) Thomas Wilson, **The Swastika.,** Washington. 1894.
   (2) R. P. Greg, **On the Meaning and Origin of the Fylpot and Swastika.,** Westminster. 1884
4. Edward Thomas, **The Indian Swastika and its Western Counterparts,** Numis matic chronicle. Vol. XX
5. පොළොන්නරු යුගයේ පිළිමවල දක්නට ලැබෙන තාන්ත්‍රික ලක්ෂණ පිළිබඳ ව මහාචාර්ය පී. ඊ. ප්‍රනාන්දු මහතා විසින් Ceylon University Review, 1960 සඟරාවට සැපයුණු **Tantric Influence on the sculptures at Galvihāra Polonnaruwa** යන හිසින් යුත් නිබන්ධය කියවන්න.
6. 'ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ වා සම්පජානකාරී හෝති' - සතිපට්ඨාන සූත්‍ත.

පොළොන්නරු හිටි පිළිම වහන්සේ

